සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: III | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

- (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අදින්න.

Department of Education _Western Province

(01) (i) ''පින්වත්නි, තෙපි හැම "සතරෝ වටලා ගත්තෝ වේදැ"

(අ) මෙම ප්‍රකාශය කවුරුන් විසින් කියන ලද්දේ ද?

(ආ) එය අසා සිටියෝ කවරහු ද?

(ii) (අ) කෘෂිකර්මාන්තය ආශ්‍රිත ජනකවි වර්ගයක් නම් කරන්න.

(ආ) විවේකය දැනුවත්කමින් හා විනෝදයෙන් ගත කිරීමට යොදාගත් ජනකවි වර්ගය හඳුන්වන්න.

(iii) චූ චෙං එන් විසින් රචිත (The Monkey) ද මන්කි නැමති ග්‍රන්ථයේ

(අ) සිංහල පරිවර්තනයේ නම කුමක් ද?

(ආ) එහි පරිවර්තකයා කවුරුන් ද?

(iv) අප බෝසතුන් මිස
අනෙකකු නො ම අසන ලෙස
සුර අර සිට අහස
තනක් සිඳුව යි කීය ඒ විගස

(අ) මෙම පදයෙන් කියැවෙන අභව්‍ය සිදුවීම කුමක් ද?

(ආ) මෙහි සඳහන් නවනළු රසයට අයත් සාහිත්‍ය රසය නම් කරන්න.

(v) අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා
විදුලි එළිය දැක ගිනිහුළ දිගේ හෙලා
අනුන් ලියන් දැක තම ලියට තල තලා

(අ) ඉහත සඳහන් කවිය සම්පූර්ණ කරන්න.

(ආ) එ කුමන වර්ගයකට අයත් ජන කවියක් ද?

(vi) "ඉතින් මට කීමට ඇති වැරැද්ද මොකක් ද?"

(අ) ඉහත ප්‍රකාශය උපුටා ගෙන ඇති ග්‍රන්ථය කුමක් ද?

(ආ) මෙම ප්‍රකාශය අසා සිටි අයගේ නම ලියන්න.

(vii) මුනි සරිපා සිඹිමින්නේ පාඩමෙහි දැක්වෙන කවි

(අ) උපුටා ගත් වීර කාව්‍යය නම් කරන්න.

(ආ) එය රචනා කරනු ලැබුවේ කවුරුන් විසින් ද?

(viii) ..............................................................................................

ආගම මිණි පහනක් වේ

එය රැක ගන්නට මෙ ලොවේ

සමත් වෙතොත් පුත නුඹ වේ

(අ) ඉහත පද්‍ය සම්පූර්ණ කරන්න.

(ආ) එහි සඳහන් රූපකයක් ලියා දක්වන්න.

(ix) (අ) ගංගාවේ සංගීතය පද්‍ය පන්තියේ රචකයා නම් කරන්න.

(ආ) එම රචකයාගේ වෙනත් කාව්‍ය ග්‍රන්ථයක නම සඳහන් කරන්න.

(x) (අ) ලෙන අතහැර යෑම පාඩමට යොදාගෙන ඇත්තේ සිංහබාහු නාට්‍යයේ කීවැනි අංකය ද?

(ආ) එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ වෙනත් නාට්‍යයක් නම් කරන්න. (ලකුණු 02×10 =20)

Department of Education - Western Province

(02) පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) එක් සිත් වැ එක දිසාව බලන්නවුන් පරිද්දෙන් පැදුම් දිග බලා සිටියහ.

(අ) මෙය කුමන අවස්ථාවක් හා සම්බන්ධ වේ ද?

(ආ) "එක් සිත් වැ, පැදුම් දිග යන පදවල අර්ථ දක්වන්න.

(ii) කඳු බැවුමක දං - බෝවිටි පඳුරු තළා

පහලට ඇදී පරමල් පෙති ඉවත නොළා

කල දෝ දියෙන් පොඟවා රන් පුලින තලා

සංගීතවත් වී යමි ඉදිරියට ගලා

(අ) අංකිත පදවල අර්ථ දක්වන්න.

(ආ) කවියේ අදහස සරල බසින් ලියන්න.

(iii) අසිරිමත් වූ දේකි මෙලොව

ප්‍රේමය නමිනා

වැනූ පොරණ කිවිඳුන් සොඳ

රසමුසු බසිනා

සියලු භෝග වස්තු ඉසුරු

හරිති තෙක් දනෝ

සව් සැප දෙන සිතුමිණ වන්

ප්‍රේමය සන්දා

(අ) ඉහත පද්‍යයට අනුව ප්‍රේමයේ වටිනාකම ප්‍රකාශවන ආකාරය ඔබේ වචනයෙන් ලියන්න.

(ආ) එහි සඳහන් භාෂා ලක්ෂණ දෙකක් ලියා දක්වන්න.

(iv) ජනාකීර්ණ සමහර ගම් මැදින් බියපත් සිවල් දෙනක මෙන් බියෙන් ඇලලී ඇකිළී යන විට

(අ) ඉහත ප්‍රකාශයට අනුව පුංචිමැණිකා බිඳවන්නේ කුමක් නිසා ද?

(ආ) එහි සඳහන් භාෂා ලක්ෂණ දෙකක් ලියා දක්වන්න.

(v) නොදනිති හසරක් නුපුරුදු එ තිදෙන
පැමිණෙන පිරිපත වලකනු කෙලෙසද

(අ) ආංකික පදවල අර්ථ දක්වන්න.

(ආ) එහි සඳහන් තිදෙනා නම් කරන්න. (ලකුණු 04×05 =20)

(03) උම්මග්ග ජාතක කථාවෙහි සාර්ථකත්වයට එහි යොදාගත්

- උපමාලංකාර
- සංවාදශීලී බස්වහර

හේතු වී ඇත. සතර කන් මන්ත්‍රණය පාඩම ඇසුරෙන් එක් කොටසකට අදාහරණ දෙක බැගින් දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 15)

නැතහොත්

- අපූර්ව කාව්‍ය සංකල්පනා හා
- විවිධ විරිත් භාවිතය

නිසා ගුත්තිල කාව්‍ය සාර්ථක නිර්මාණයක් වී අත. එක් කොටසකට උදාහරණ දෙක බැගින් දක්වමින් අගයන්න. (ලකුණු 15)

(04) පාඨක සිතෙහි අනුකම්පාව ඇති වන අයුරින්

- කර්ලිනාහාමිගේත්
- පුංචි මැණිකාගේත් (ලකුණු 15)

චරිත නිරූපණය බැද්දේගම කතුවරයා සමත් වී ඇත. නිර්දිෂ්ට කොටසින් එක් චරිතයකට නිදසුන් දෙක බැගින් දක්වමින් විමසන්න. (ලකුණු 15)

නැතහොත්

සිංහබාහු නාට්‍යයෙහි

- කරුණා රසයත්
- වීර රසයත්

ජනනය කිරීම සුප්පා දේවියගේ හා සිංහබාහු දරිත යොදාගත් ආකාරය නියමිත නාට්‍ය කොටස ඇසුරින් එක් කොටසක් සඳහා උදාහරණ දෙක බැගින් ගෙන පැහැදිලි කරන්න.(ලකුණු 15)

**05, 06, 07 ප්‍රශ්නවලින් එකකට උත්තර සපයන්න. වචන 120 - 150ත් අතර විය යුතු ය.**

(05) "ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි ප්‍රතිභාපූර්ණ කවියෙකි" "මුනි සිරිපා සිඹිමිනන්නේ" පද්‍ය පන්තිය ඇසුරෙන් නිදසුන් තුවක්වත් දක්වමින් ඉහත ප්‍රකාශය විමසීමට ලක් කරන්න. (ලකුණු 10)

(06) එච්.එම්.කුඩලිගම කවියාගේ "ගංගාවේ සංගීතය" පද්‍ය පන්තිය අජීව පරිසරයට සජීවී බව ආරෝපණය කරමින් නිරූපණය කර ඇති ආකාරය නිදසුන් තුනක්වත් දක්වමින් අගයන්න. (ලකුණු 10)

(07) පරිසර අත්දැකීම් උපයෝගීකොට ගෙන උපදෙස් ලබාදීමට ජන කවියා සමත් වී ඇති අයුරු "හාන හීය පාන අඬහැරෙන් දැනේ පද්‍ය පන්තිය ඇසුරෙන් නිදසුන් තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)



Department of Education – Western Province